ගඟ අද්දර කළු මිනිසුන්ගේ වාඩියෙන් කුඩා ළමුන් ඩැහැගෙන යන්නට මිනිසුන් - පොලිස් භටයන් හා ආණ්ඩුවෙන් කවුද පැමිණි ඒ උදයේ, පළමුවෙන්ම හට ගත්තේ වචනයෙන් කිව නොහැකි විදියේ හද කම්පාවක් සහිත භීතියකි. ඊළඟට ළතෝනිය දරු සිඟිත්තන් ඇද ගෙන දුවන්නට තැත් කරමින් සී සී කඩ යන ගැහැනු. තමන් කිසි දාක අසා නැති මේ අළුත් සුදු නීතිය ඉදිරියේ කර කියා ගත හැකි කිසිවක් නොමැතිව බුම්මා ගත් පිරිමි. එසේ මර හඬ දෙන කල්ලියන් සියල්ල දුටු පොලිස්කාරයන් තුළ පවා හට ගත්තේ එපා කරපු හැඟීමකි. කළු හැතිකරය තරමක් වත් හැප්පෙන්නට ඉදිරිපත් වූවා නම් සැබැවින්ම ඔවුන් කැමති වනු ඇත. එසේ වූයේ නම් තමන් කරන දේ යුක්ති සහගත බවට හැඟීමක් ඇති කරගන්නට ඔවුන්ට ඉඩ තිබිණ.

එහෙම දෙයක් නැත. මුන් නිකම්ම එය බාරගෙන. මේ නිවට නියාලු කම ඔවුන්ගේ ඇඟට පීරණ වී ඇත.

සිය කුඩා කොලු පැංචා අල්ලාගත් බීජී මම්බිලර්ගේ ලේලිය අඳුරු මණ්ඩිය අස්සෙන් ගඟ දිසාවට දිව්වාය. පොලිස්කාරයාගේ නෙතට ගොදුරු වූ ලෝකය හරහා සෑහෙන වේගයකින් යා ගන්නට හැකි අයුරින් ඇගේ කැහැටු කකුල් මාරු නොවන්නා සේය. සිදු වන්නට යන්නේ කුමක්දැයි ඇය දත්තාය. ටුබැකෝ ටවුමට නුදුරින් පිහිටි වාඩියකදී මෙයට සතියකට පෙර මෙය සිදු වී ඇත. ඇගේ නෑනා - රුතීගේ දරුවකු නැතිව ගියේ ඒ අයුරිනි.

"අපි ඇයව නියම තාලෙට ඇති දැඩි කරනවා" යි ඔවුන් රුතීට කියා ඇත. "ලොකු ඉස්කෝලෙකට දාලා හොඳ අධ්‍යාපනයක් දෙනවා. හරිද ? උඹ කැමති නැද්ද උඹේ දරුවා හරි හමන් විදියට හැදිලා ජේසු ස්වාමීන් ගැන ඉගෙන ගන්නවාට ?

රුතීට කට උත්තර නැතිව ගියේය.

ඒ ගොල්ලෝ කවුද ?

ඇයට තේරුණේ නැත. මේ තමාගේ කුඩා දැරිය බව පමණි ඇය දත්තේ. ඊ ළඟට වචන ගොඩාරියක් ඔනෑවටත් වැඩියෙන්. ඊළඟට අත් !

එතැන බියකරු කඹ ඇදිල්ලක් සිදු විය. අම්මා කුඩා දැරිය අල්ලගෙන. දැරිය මවගේ ගවුමේ එල්ලීගෙන. ශුභ සාදක නිලධාරියා සහ පොලිස් භටයෝ - සියල්ලෝම අදිති. දැරිය විලාප නගයි. අනෙක් අම්මලා ඇස් උලුප්පාගෙන - තම තමන්ගේ දරුවන් බදාගෙන - ගල් ගැසී බලා සිටිති. පිරිමියෙක් අහළක නැත. පිරිමින් රවට්ටලා වාඩියෙන් පිටතට යවලා.

ඉක බිඳ බිඳ අඬනවා හැරෙන්නට වෙන කළ හැකි දෙයක් රුතීට නැත. එහෙත් දරුවා වාහනය වෙත ඇද ගෙන යාමට පොලිස් භටයා සැරසෙත්ම ඇය දෙස් තියන්නට පටන් ගත්තාය. අහස දෙකට පළා බිමට ඇද තමා පිට පතිත කරවන දෙස් තිබිල්ලක් ! වාහනය අඹා සැතපුම් දෙකක්ම ඇය දුව යයි. අසු පිටින් ආ පොලිස් භටයෙක් එවිට ඇයට තරවටු කරයි. ඇය නොවේ එය ගණනකට ගත්තේ. දුව ගෙන යයි. අශ්වයා පන්නාගෙන එන පොලිස් භටයා අතෙහි වූ ලොකු කසයෙන් ඇගේ මුහුණ හරහා පහර දෙයි. එකක්. දෙකක්. ක්‍රාස් ! ක්‍රාස් !! ඉන් නැගෙන වේදනාව සමඟ මුසු වන හැඬීමක් ! ඇය පාරෙන් පැන ගස් අතරට දුවයි. ඇය හඹා යන්නට ඔහුට බැරිය. කටු පඳුරු සමග පොර බදිමින් ඇය වාහනය පස්සේ දිගට ම දුවයි. එයින් වැඩක් නැත. රිය යන්නේ ඇයට කිට්ටු නොකළ හැකි වේගයෙන්. ඊ ළඟට ටුබැකෝ ටවුමේ සිට එන දුම්රිය පීලි දිගේ ඇදී එයි. ඇය සිය කුඩා දැරිය දකින අන්තිම වතාව ! කළු දෑතක් හා දෙපයක් දඟලන ආකාරය ! ලොකු සුදු මිනිහා දුම්රිය මැදිරියට දමනු වස් පාරෙන් ඔසොවන විට පොර බදන දැරියන්ගේ දෑත් සහ දෙපා !

"ඔයාට තව දරුවෝ ලැබේවි" යි නෙලී මම්බිලර් ඇය සනසන්නට තැත් කළාය. "තව දරුවෝ ලැබේවි ළමයෝ !, එහෙත් රුතී කිසිවක් නොකොට හිටිවනම බලා උන්නාය. පුටුව පද්ද - පද්දා. අඬ අඬා. අනෙක් කිසි ගැහැනියනට ඇයට පිහිටක් විය නොහැක. ඔවුන්ගේ දරුවනුත් පැහැර ගෙන ගොසිනි. පිරිමින් කොතරම් කිපිලාද කිවහොත් ඉඩක් ලැබුණු හැම විටකම බොන එකය, ඔවුන් කළේ. ළඳු කැලෑවක් ගිනි තැබුවාක් මෙන් ඔවුන්ගේ කෝපයද දැවෙයි.

හැම දෙයක්ම නැති වෙලා. ඉඩම්, දඩබිම්, ගඟ, මාළු, අහිමි වෙලා. අළුත් දෙවියෙක් ඇවිත්. වයසක ඇත්තො තවමත් මිනිසුන් මැරූ හැටි කියති. තමන්ගේ උදවිය මැරුම් කෑ හැටි ඔවුන්ට මතකය.

"දැන් උන් අපේ දරුවන් අරන් යනවා." ජැකී මම්බිලර් මෙසේ කීවේ සිය පියා වූ බිජීටය.

"අපි දැන් දරුවො හදන්නේ සුද්දන්ට දෙන්න. උන්ට බැරිද උන්ගෙම දරුවො හදා ගන්න ? ! ඔක්කොම ඩැහැ ගන්නවා. ඉඩ කඩම්. දරුමල්ලෝ. දෙන දෙයක් නැහැ. ගන්නවා විතරයි !"

ඒ කියන්නේ - සුදු මිනිසුන් පාරේ එනවා දකින විටම වෙන්නට යන දේ නෙලී දැන ගත්තාය. අනෙක් ගැහැනු බිය පත්ව මුල් ඇදගත්තාක් මෙන් හිටි තැනම සිටියහ. වෙවුල වෙවුලා. මුනු මුනු ගගා. ගල් ගැහිලා. "උඹ කරදරේ වැටෙනවා" යි ඔවුහු අනතුරු ඇඟවූහ. "උඹ කරදරේ වැටෙනවා"

"කමක් නැහැ" යි නෙලී කීවාය. "ඒ ගොල්ල කොහේද මගේ කොල්ලා අරන් යන්නේ ?"

ඇය ඝන වනාන්තරේ අමාරුම හරියට රිංගා ගත්තාය. ගඟ අද්දර පාර මඟ හැර. බඩු පොදි ගෙන යන පාරට නුදුරින්. දරුවා ළමැදට තද කරගෙන, වැල් අස්සෙන්, මුල් උඩින් දනිපනි ගා ගෙන ගියාය. කොළවලට - කඩුවලට - සීරි තුවාල වෙද්දී. බියෙන් දෑස් ලොකු කරගෙන. වරින් වර ගිලමින් හඬන දරුවා සිය තෙහෙට්ටු සිරුරට ඇලී ගෙන සිටියදී.

කලින් අවුරුද්දේ සිදුවූ එබඳු දෙයක් ගැන ඔවුන් කතා වෙනවා ඇය අසාගෙනය. ඒ ඔවුන් සියළු දෙනාම ටින් ටවුම කිට්ටුව උන් අවදියේ. ආණ්ඩුවෙන් කීවේ ඔක්කොටම කෝච්චියට එන්න. ලොකු පුදුමයක්. හැමෝම ගියේ දුම්කොළ - කෑම ජාති - බිලැන්කට් - දේවි කියලා හිතගෙන. පිරිමින් හැම දෙනාම උදේ පාන්දරින් එක්කන් ගියා දැව වැඩපොළේ ලී අදින වැඩට උදව් කරන්නට කියා. ගැහැනු බලා ගෙන ඉන්නවා කෝච්චිය එන තෙක්. බොහොම උනන්දුවෙන්.පොඩි එවුන් ඔක්කොම සෙල්ලමට වැටිලා. මෙසේ තිබියදීය, පොලිස් භටයන් දෙදෙනෙකු අවුත් දරුවන් අල්ලන්නට පටන් ගත්තේ. ඔවුහු දරුවන් හැම දෙනාම අල්ලා ගත්හ. දරුවෝ හඬන්නට ගත්හ. ගැහැනු වැළපෙන්නට වූහ. සමහරු ගෙන යන දරුවන්ගේ ඇගේ එල්බ ගත්හ. සමහරු කුඩා කෝටු වලින් තමන්ටම ගසා ගන්නට පටන් ගත්හ. කෝපයට පත් පොලිස් භටයෙක් ඔවුන් පස්සට තල්ලු කරන්නට විය. දිගටම - දිගටම - තල්ලු කළේය. ඒ අතර වාරයේ දුම්රිය අද්දන්නට විය. කුඩා ළමයි දුම්රිය කවුළුවල එල්ලීගෙන බලන්නට වූහ. දුම්රියේ සිටි සුදු කතක් ඔවුන් ඇතුළට ඇද දමන්නට පටන් ගත්තාය.

නෙලී ටික ටික නැවති නැවතී බල බලා, පඳුරු වල කටු ඇන ගනිමින්. මඟ හැර හැර යන්නට වූවාය. වාඩියේ ගැහැනුන්ගේ අඳෝනාව තවමත් ඇසෙයි. හති දම දමා කටාන් හුස්ම ගනිමින් ගොස් ගඟ හරහා බාගයක් දුරට විහිදුණු වැලි තීරයක් තිබෙන ඉසව්වට බැස ගත්තාය. එතැනින් එගොඩ වුණොත් අඩිපාර හිටීවි. අඩි පාර මක මකා ඉන්න වෙලාවක් නැත. එහෙයින් යළිත් කැලෑවට රිංගා ගත් ඇය දරුවා තදින් තුරුළු කරගෙන වෙවුල වෙවුලා බලා සිටියාය. ඇඟට තද කරගෙන දරුවා හඬන සද්දය වළක්වන්නට තැත් කළත් දරුවාගෙ හැඬීම නැවතුණේ නැත. එසේ හෙයින් පඳුරක් අස්සට රිංගාගෙන කුදු ගැසුණු ඇය ටික වේලාවක් තනය කටට දී දරුවා නළවා ගත්තාය. කිරි උරන දරුවා වටකුරු දෑසින් සිය මුහුණට ඔරොවද්දී මඳක් ඉස්පාසුවක් ලද්දාය.

කෑ කෝ ගහන හඬ වන ගහණ ඔස්සේ දිව ගියේ වැල් ගොඩක් ඇදෙන්නාක් මෙනි.

වන පෙත වසා ගත් තුරු-පත් ආවරණය සිදුරු කරගෙන අඳෝනා හඬ පැමිණියේය.

හිටි හැටියේ අත ළඟම වාගේ බල්ලෙක් බිරුවේය. නෙලී යන්තම් නැගිට ගත්තාය. දරුවා තවමත් තනය එල්බ ගෙනය. ඇය ගඟ අද්දර වැලි පාර දිගේ යන්නට වූවාය. වැටි වැටී - ඇට කටු පෑදුණු සරීර කූඩුව අමාරුවෙන් අද්ද අද්දා. විහිදෙන අතු රිකිලි අස්සෙන් ඇනෙන කටු මැද්දෙන් - රිංගාගෙන හැතැප්ම බාගයක් ගියාය. හැතැප්මක්

කෙටි කතාව




# හිත ගිය තැන (මාළිගාව)

# පැල්පතයි

*තියා ඈස්ට්ලිගේ කෙටි කතාවක සිංහල පරිවර්තනය*

ඩී. බී. කුරුප්පු විසිනි

ගියාය. තව ටිකකින් කැලෑව ඉවර වී ජෝජ් ලැෆීගෙ ඉඩමේ මායිම් වැටට ළං වන්නට පුළුවන් බව පෙනෙන තෙක් ගියාය. ඒ ගොවිපොළේ තමයි බීජී මම්බිලර් ඇවිත් වැඩ කළේ. නෙලීත් එහි වැඩ කොට ඇත. වරින් වර තරුණ ලැෆී නෝනා අච්චාරු වැනි දේ සාදන විට - සෝදන්නට - සුද්ද බුද්ද කරන්නට - උදව් වෙවී.

කිසි නිනව්වක් නැතිව වැට ගාව මොහොතක් බලා උන්නාය. එක් වරම හිතක් අවේය. කම්බි පටවලට යටින් දරුවා තල්ලු කළාය. ඉන් පසු ඇයත් රිංගා ගත්තාය. තණ කොළ පුසුඹ - කූඹීන්ගේ පුසුඹ - කුණු රොඩු සහ පණ ඇති හැම ජාතියකම පුසුඹ - ඇගේ නාසයට දැනෙන්නට විය. දරුවා ඩැහැගත් ඇය දෙනුන් කවන තණ බිම හරහා අඹ අරඹට දිව ගත්තාය. කුකුල් කොටුව පසු කරගෙන, එළවළු පාත්තිය පසු කරගෙන, පිපුණු මලින් බර තණ බිම ඔස්සේ ටියුලිප් ගස්වල සුවදායක සෙවණැලි පසු කර ගෙන, පොළොව කොටමින් සිටි ලැෆී මහතා පසු කර ගෙන දිව්වාය. ඔහු තමා දෙස බැලුවත් නොනැවතී, බියපත්ව, කටින් හුස්ම ගනිමින් ඔහු පසු කොට පැත්තකින් ගේ වටා ගොස් පිළිකන්නේ පඩිය ළඟට, කොයි වේලේත් විවෘතව තබන දොර වෙතට දිව ගියාය.

මැග් ලැෆී දොරකඩට ආවාය. කුරුමිණි සතුන්ගේ කන්කරච්චලය අස්සේ තරුණ ගැහැණු දෙන්නා එකිනෙකා දෙස බලාගෙන උන්හ. පිටු පස කාමරයක අත දරුවකු හඬනවා ඇසෙයි. කුඩා දැරියක් මවගේ සායෙන් අදින්නට වූහ.

නෝනා කතා කළාය. නිවලා, ඉක්මනට එන්න. නෙලීට කිසිවක් ඇසෙන්නේ නැත. නෝනා නෙලීගේ අතින් අල්ලා ඇදලා - හෙමිහිට - හෙමිහිට - ගෙතුළට ගත්තාය. එහෙත් ඇය බිරාන්තවී චාලිව බදා ගෙන උන්නාය. අත අරින්නේම නැත. බැරිම තැන සුදු නෝනා ඇගේ දෙවුරට අත තබා කුස්සියේ පුටුවකට ඇය පාත් කළාය. ඉන්දවා දෑත් තද කර ගෙන "ආං ! දැන් ඔහොම ඉන්න. නොහෙල්ලී" යනුවෙන් කීවාය.

නෙලී නොසැලී සිටියාය. ලස්සන සුදු නෝනා ඇගෙන් විමසුවාය.

"කියන්න නෙලී, මොකද උණේ කියලා. මට කියන්නකො."

කතන්දරේ කියන්නට ටික වේලාවක් ගත විය. නාහෙන් ඇඬිලි පෙරුත්ත කිරීමේ අස්සේ, හුස්ම ගිල ගනිමින් හිර කර ගත් භීතියෙන් යුක්තව.

"මට තේරෙනවා" අන්තිමට මැග් ලැෆී කිවාය. "මට තේරෙනවා" ඇග් දෙතොල් තදින් පියවෙයි "ඔව් මට තේරෙනවා"

නෙලීගේ දෙවුරට තිබූ දෑත් බුරුල් කළ ඇය දරුවා රැගෙන සිය කුඩා දියණිය ළඟින් බිම තැබුවාය. කුඩාවුන් දෙන්නා ටික වේලාවක් එකිනෙකාගේ මුහුණ දෙස බලා සිට, අත් අල්ලා ගන්නට ළං වන සැටි දැක මුහුණට සිනාවක් නගා ගත්තාය. උඳුන වෙත ගොස් තේ පෝච්චියට උණු වතුර වත් කළාය. තේ කෝප්පයක් කළු කෙල්ලට දුන්නාය. "දැන් ඕක ඔක්කොම බීලා ඉන්න. ඊට පස්සේ අපි කරන්න දෙයක් හිතලා බලමු. ජෝජ් හිතාවි මොකද කරන්නේ කියලා."

පොලිස් භටයන් ආවේ පැය බාගයකට පසුවය.

දුම්රිය මාර්ගයේ සිට එන පාර දිගේ ඔවුන් අසුන් පන්නා ගෙන ආවේ සටනට එන්නාක් මෙනි. මුල්ලුවකට බර තියා ගෙන උන් ජෝජ් වෙත පැමිණි ඔවුහු නැවතුණහ.

ඔවුන්ගේ ප්‍රශ්න වලින් ජෝජ් කිසිවක් සිතා ගත නොහැකි තත්වයට පත් විය.

"අපේ වැඩකාර කෙල්ල විතරයි"

මෙසේ කී ඔහු තවත් මෙසේද කීවේය.

"මැග් ඉන්නවා. දරුවොත් ඉන්නවා."

ඔහුගේ පිළිතුරු වදන් අසමින්ම පොලිස් භටයෝ අසුනට පයින් සන් කළහ. බුරුල් කරන ලද පසට ම තදින් ඇන මුල්ලුව සිට වූ ජෝජ් පඩි පෙළේ ගරාදි වැටේ අසුන් ගැට ගසන්නට යන ඔවුන් පස්සෙන්ම ආවේය. පාවහන් තදට පඩිය මත ගසමින් ඔවුන් ගෙට පිවිසෙනවා ඔහු බලාගෙනය. ගෙය අත්ල විදහා පෑවාක් මෙන් විවෘතව ඇත.

බරාඳයට ආ මැග් ඔවුන්ට හරස් වූවාය. ඇගෙ සකල ශරීරයම අභියෝගයකි.

"ඔව්" ඇය විමසුවාය. "මොකද මේ ?"

ලොක්කො දෙන්නා මඳක් පසු බා සිටියහ. මීට කලිනුත් ඔවුන් ජෝජ් ලැෆීගේ භාර්යාව සමග හැප්පී ඇත. තේරුම් ගන්නට අමාරු තරුණ ලාමක ගැහැනියක් ! කවදාවත් තමන්ගේ තැන තේරුම් නොගත් ගැහැනියක් ! ඕනෑම වේලාවක මොකක් හරි මතයක් ඉස්සරහට දමයි. ඇය කොතරම් නම් ජෝජ් ගේ හිත දිනා ගත්තීදැයි ඔවුහු නොදත්හ. අවුරුදු ගණනාවකට උඩදී දකුණට ගිය ගමනකදී සිදාදියේ අදහස් දරන සිදාදියේ කෙල්ලක කර ගහ ගෙන සෙල්ලක්කාරයා වාගේ ආපසු ආ අහිංසක ස්වාමිපුරුෂයෙකු වූ මේ තක්කඩියාට ඔවුන් අනුක්පා කළේ එහෙයිනි.

"ආණ්ඩුවේ නියෝගයක් නෝනා" එකෙක් පැවසීය. "කළු පැටව් ඔක්කොම අහුලා ගෙන යන්න අපට කියලා තියෙන්නෙ. විශේෂ පුහුණු පාසල්වලට දාන්න ඔක්කොම අරන් යන්න ඕනෑ. ඒකයි නියෝගය."

මැගී ලැෆ් උනන්දුවෙන් උතුරා යන ඔවුන්ගෙ මුහුණු පිරික්සුවාය. ඇයට සිනහව යටපත් කරගන්නට නොහැකි විය.

"ආං ! සාජන්, මගෙන් අහන්නේ මට දෙමුහුන් දරුවන් ඉන්නවද කියලද ? නැත්තන් මට ඔබ කියන එක තේරෙන්නේ නැද්ද ?"

ඔවුන්ගේ පිළිතුර ලැබෙන තෙක් ඇයට ඉවසුමක් නැත.

යටි තොල විකා ගත් සැරයන් පිළිතුරු දෙන්නට කලින් මොනවදෝ සපන සැටියක් දිස් විය.

"ඔබේ දරුවො නෙමෙයි නෝනා"